**මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව**
**අනුරාධපුර දිස්ත්‍රික්කය**

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 30 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 ජූනි 06 දිනද.විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 ජූලි 02 දිනද සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3. තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා අනුගමනය කළ ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව් කර නොතිබුණි. | ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළයුතුවේ. | පිළිතුරු ඉදිරිපත් කර නැත |

(ආ) ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | උසාවි දඩ ආදායම රු.6,125,749 ක් වුවද රු.6,286,746 ක් ලෙස ආදායම් වියදම් ගිණුමේ දක්වා තිබීම නිසා අතිරික්තය රු.160,997 ක් වැඩියෙන් දක්වා තිබුණි. | ආදායම නිවැරදිව ගිණුම් ගත කලයුතු වේ. | 2018 දෙසැම්බර් මාසයට අදාලව ලැබිය යුතු උසාවි දඩ වටිනාකම පළාත් ආදායම් දෙපාර්තමේන්තුවෙන් දන්වා නොතිබුණි. |
| (ii) | ලැබිය යුතු උසාවි දඩ ආදායමින් , 2017 වර්ෂයේ මැයි සහ ජූනි මාසවලට අදාලව ලැබිය යුතු රු.808,996 ක් ගිණුම්ගත කර නොතිබුණි. | ආදායම හඳුනාගෙන නිවැරදිව ගිණුම් ගත කළයුතු වේ. | පිළිගතිමි.<br>2017 වර්ෂයේ මැයි හා ජූනි මාසයට අදාල වටිනාකම් ගිණුම්ගත නොකිරීම හේතුවෙන් රු: 808,996.00 ක් අඩුවෙන් ගිණුම් ගත කර ඇත. |
| (iii) | සමාලෝචිත වර්ෂයේ මිලදී ගෙන තිබුණු රු.346,035 ක් වූ වායු සමීකරණ යන්ත්‍ර 3 ක වටිනාකම | නිවැරදිව ගිණුම්වල දැක්විය යුතු වේ. | පිළිගතිමි.<br><br>වායු සමීකරණ යන්ත්‍ර 03 ක වටිනාකම |

| | | | |
|---|---|---|---|
| | ස්ථාවර වත්කම් වල රු.34,035 ක් ලෙස දක්වා තිබීම නිසා ස්ථාවර වත්කම් රු.312,000 ක් අඩුවෙන් දක්වා තිබුණි. | | ගිණුම් ගත කිරීමේ දී නිවැරදි වටිනාකම වන රු: 346,035.00 ක මුදල රු: 34,035.00 ලෙස වැරදිමකින් ගිණුම් ගත වී ඇත. |
| (iv) | සභාව සතු 2007 වර්ෂයේ ලැබී තිබුණු WP SE 2828 දරන අත්ට්‍රැක්ටරයේ වටිනාකම රු.175,000 ක්වූ අතර එම වටිනාකම රු.1,750,000 ක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | ගිණුම් නිවැරදිව පිළියෙළ කල යුතු වේ. | පිළිගතිමි. |
| (v) | 2017 වර්ෂයේ රු.3,640,264 ක් වැය කර ඉදිකර තිබූ කසල අංගනයේ වටිනාකම ස්ථාවර වත්කම් යටතේ ගිණුම් ගත කර නොතිබුණි. | වර්ෂයේ සියළු ප්‍රාග්ධන වියදම් ගිණුම්වල දැක්විය යුතුවේ. | පිළිගතිමි.<br>කසළ අංගනයේ වටිනාකම ගිණුම්ගත කිරීමට කටයුතු කරමි. |

(ඇ) නොසැසඳුණු ගිණුම්

--------------- ------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ගිණුම් විෂයයන් 5 ක වටිනාකම හා ඒවාට අදාලව ඉදිරිපත් කර ඇති උපලේඛන වල දැක්වෙන වටිනාකම් අතර රු.3,058,937 ක නොසැසදීමක් විය. | අදාල ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළයුතු වේ. | පළාත් පාලන දෙපාර්තමේන්තුවේ අපදා ණය වැටුපෙන් අඩුකිරීම් සහ ප්‍රාදේශීය සභාවේ සේවක ණය ශීර්ෂය යටතේ ප්‍රාස 04 වාර්තාවල සටහන් කිරීමේදී සිදුවූ වරද නිසා මෙම වෙනස සිදුවී ඇත. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට රු.303,613,965 ක් වූ ආරම්භක ගිණුම් ශේෂ 31 ක් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වලට රු.288,578,148 ක් ලෙස ගෙන තිබීම නිසා රු.56,456,450 ක එකතු වෙනසක් විය. | සහතික කරන ලද පෙර වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ශේෂයන් සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂය ලෙස ගත යුතු වේ. | ඉදිරිපත් කර නැත |

(ඇ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

-----------------------------------

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | වර්ෂ ගණනාවක සිට පැවත එන එකතුව රු. 3,075,611 ක් වූ ලැබිය යුතු ගිණුම් ශේෂ 06 ක් සමාලෝචිත වර්ෂය තුලදී අයකර කර ගෙන නොතිබුණි | ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. | 2019 ගිණුම පිළියෙල කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (ii) | පූර්ව වර්ෂ කිහිපයක සිට පැවත එන එකතුව රු.4,355,666 ක් වූ ගෙවිය යුතු ගිණුම් විෂයයන් 4 ක් සමාලෝචිත වර්ෂය තුලදී ද නිරවුල් කරගෙන නොතිබුණි. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරිමට කටයුතු කල යුතු වේ. | කර්මාන්ත ලේඛන නිසි පරිදි නඩත්තු නොවීම හේතුවෙන් මෙම මුදල් වැය වූ ආකාරය හඳුනා ගැනීමට නොහැකි විය. |

(ඉ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වටිනාකම රු.125,229,278 ක්වූ ගිණුම් විෂයයන් 04 කට අදාලව වත්කම් ලේඛන, හිමිකම් සහතික, ශේෂ සනාථ කිරීමේ ලිපි සහ විස්තරාත්මක උපලේඛන ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී ඒවා සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති වටිනාකම් සනාථ කිරිමට අවශ්‍ය ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළයුතු වේ. | පිළිගනිමි. |

1.4. අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි හා කළමණාකරන තිරණ වලට අනුකූල නොවීම.

| | නීති, රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | සභාව සතු වාහන 12 ක් සම්බන්ධයෙන් ඉන්ධන දහනය පිළිබඳව පරික්ෂාවක් සිදුකර නොතිබුණි. | චක්‍රලේඛයට අනුව කටයුතු කලයුතු වේ. | පිළිගනිමි. චක්‍රලේඛ ප්‍රකාරව ඉදිරියේ දී කටයුතු කරමි. |
| (ආ) | 203 අධිකාරිය මෝටර් වාහන පනත 2.1 වගන්තිය | වසර ගණනාවකට පෙර සභාවට ලැබී තිබුණු ට්‍රැක්ටර් 02 ක්, ටේලර් 02, බවුසර් 02 ක් සහ අත්ට්‍රැක්ටරයක් 2018 වර්ෂය අවසන් වන විටත් ලියාපදිංචි කර නොතිබුණි. | පනතට අනුව කටයුතු කළයුතු වේ. | වාහන ලියාපදිංචි කිරීමට ඉදිරියේ දී කටයුතු කරමි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2045 සහ 2011 නොවැම්බර් 10 දිනැති ගැසට් නිවේදනය | 2018 වර්ෂයේදී ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සභාවට අයත් මාර්ගවල බොරළු කියුබ් 13021 ක් ප්‍රවාහනය කිරීම වෙනුවෙන් රු.1,154,600 ක ගාස්තු අය කිරීම සිදුකර නොතිබුණි. | ගැසට් නිවේදන අනුව කටයුතු කළයුතු වේ. | බොරළු සඳහා රාජ්‍ය භාගය ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් අය කරනු ලැබුවද සභාවේ මාර්ගවල බොරළු සඳහා ගාස්තු අයකර නොමැත. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.6,578,175 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.9,166,099 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම් බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2018 ඇස්තමේන්තුගත ආදායම | බිල්කල ආදායම | රැස්කල ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2017 ඇස්තමේන්තුගත ආදායම | බිල්කල ආදායම | රැස්කල ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| i. | වරිපනම් හා බදු | 480,000 | 337,930 | 337,930 | 2,113,950 | 515,000 | 316,350 | 316,350 | 2,113,950 |
| ii. | කුලී | 5,533,525 | 3,771,743 | 3,690,701 | 1,308,382 | 5,249,192 | 3,328,167 | 2,396,505 | 1,227,340 |
| iii. | බලපත්‍ර ගාස්තු | 1,982,680 | 1,083,408 | 1,083,408 | - | 976,500 | 1,391,928 | 1,391,928 | - |
| iv. | වෙනත් ආදායම් | 8,000,000 | 10,286,746 | 5,444,997 | 20,277,231 | 6,000,000 | 6,949,393 | - | 15,435,482 |
| | | 15,996,205 | 15,479,827 | 10,557,036 | 23,699,563 | 12,740,692 | 11,985,838 | 4,104,783 | 18,776,772 |

#### 2.2.2 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වර්ෂ කිහිපයක සිට පැවත එන රු.1,403,550 ක් වූ හිඟ හිටි කසල සේවා ගාස්තු අයකර ගැනීම සඳහා සභාව විසින් විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. | කසල සේවා ගාස්තු අය කිරීමේදි ගිවිසුම් ගත කිරීමක් සිදු නොකර ආදායම් එකතු කිරීම හේතුවෙන් හිඟයක් පවතින අතර එම හිඟය කපා හැරිමට කටයුතු කරමි. |

#### 2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ රු.6,332,674 ක් හා මුද්දර ගාස්තු රු.13,944,557 ක් විය. | නිරවුල් කරගැනීමට කටයුතු කළයුතු වේ. | අයකර ගැනීමට කටයුතු කරමි. |

03. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්ය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය,පොදු උපයෝගිතා සේවා පොදු මංමාවත් පිළිබඳ කාරණා, විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධන යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ). අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 28 ක් ඉටුකිරීම සඳහා අතුරු පනවා නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා පැනවීමට කටයුතු කල යුතු වේ. | අතරු ව්‍යවස්ථා පැනවීමට කටයුතු සිදු කරමින් පවතින බව ප්‍රකාශ කරමි. |

(ආ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| බල ප්‍රදේශයේ ජනනය වන කැලි කසල කළමනාකරණය සඳහා 2016 වර්ෂයේදි ලෝලුගස්වැව ප්‍රදේශයේ රු.3,640,264 ක වියදමක් දරා පිළිසරු මධ්‍යස්ථානයක් ඉදිකර තිබුණද මේ දක්වා විධිමත් කසල කළමනාකරණයක් සිදු නොවන බව අනාවරණය වු අතර එකතු කරනු ලබන කසල වෙන්කිරීමකින් තොරව ව්‍යාපෘති මධ්‍යස්ථානයේ අවිධිමත් ලෙස වල දැමීම සිදු කරනු ලබන බව අනාවරණය විය. | 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතට අනුව කටයුතු කළ යුතුවේ.ඝන අපද්‍රව්‍ය විධිමත්ව බැහැරකිරිම, අපද්‍රව්‍ය වර්ගකර ලබාගැනීම කසල කළමණාකරන මධ්‍යස්ථානය විධිමත්ව ආරම්භ කිරිමට කල යුතුවේ. | ඉතා විශාල භූමි ප්‍රදේශයක් සහිත මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය කසළ එකතු කිරිම හා කළමනාකරණ කටයුතු සඳහා ප්‍රමාණවත් සේවකයින් නොමැති නිසා කසළ කළමනාකරණය නිසි පරිදි සිදු කිරීමට අපහසු බව ප්‍රකාශ කරමි. |

(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| එක්සත් ජාතින්ගේ සංවිධානයේ තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳ පිළිබඳව සභාව දැනුවත් වී නොතිබුණි. | තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030 අනුව කටයුතු කළයුතු වේ. | මෙම වැඩසටහන යටතේ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට ප්‍රමාණවත් මුදල් සභාව සතු නොවීම නිසා මෙම සංවර්ධන ඉලක්ක ක්‍රියාත්මක කිරීමට නොහැකි වී ඇත. |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභා බල ප්‍රදේශය තුළ, හදුනාගෙන තිබුණු අනවසර ඉදිකිරීම් 32 ක් | අනවසර ඉදිකිරිම් සම්බන්ධව අවශ්‍ය කටයුතු කිරීමට සභාව | තන්තිරිමලේ පූජා නගරයේ අනවසර ඉදි කිරීම් සම්බන්ධ අදාල පාර්ශව දැනුවත් |

| | | |
|---|---|---|
| සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | කටයුතු කළ යුතු වේ. | කර ඇති අතර, අනවසරයෙන් ඉදි කර ඇති කඩ කාමර සම්බන්ධයෙන් ද අදාල පාර්ශවයන් හා දිස්ත්‍රික් ලේකම් තුමාද දැනුවත් කර ඇත. ඉදිරියේදී ඒ සඳහා ක්‍රියා මාර්ග ගැනීමට කටයුතු කරනු ලැබේ. |

3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවේ අනුමත කාර්ය මණ්ඩලය 55 ක් වන අතර , 2019 මාර්තු 31 දිනට ස්ථිර කාර්ය මණ්ඩලයේ 39 ක් සහ අනියම් කාර්ය මණ්ඩලය 07 දෙනෙකු ලෙස සමස්ත කාර්ය මණ්ඩලයේ 46 දෙනෙකු සේවයේ යොදවා තිබුණි. එ් අනුව ස්ථිර කාර්ය මණ්ඩලයේ නිලධාරින් 18 දෙනෙකුගේ පුරප්පාඩුවක් හා කාර්ය මණ්ඩල 2 කගේ අතිරික්තයක් පැවතුනි. | කාර්ය මණ්ඩල පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | පළාත් පාලන දෙපාර්තමේන්තුව වෙත හා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ නමුත් සේවක පුරප්පාඩු පවතින අතර, අතිරික්ත සේවකයින් මඟින් පුරප්පාඩු සේවකයින්ගේ රාජකාරී අවරණය කර ගනු ලබයි. |

3.4 වත්කම් කළමනාකරණය

3.4.1 නිශ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව සතු වටිනාකම රු.2,450,000 ක් වූ වාහන 7 ක් වසර 02 සිට 05 දක්වා කාලපරිච්ජේදයක සිට නිශ්ක්‍රියව පැවතුණි. | අළුත්වැඩියා කිරිම ඵලදායී නොවන වාහන අපහරණය කිරිමට කටයුතු කළයුතු වේ. | මෙම පාවිච්චි කළ නොහැකි තත්ත්වයේ පවතින වාහන සම්බන්ධයෙන් 2019 භාණ්ඩ සමීක්ෂණයේදී සුදුසු ක්‍රියා මාර්ග ගැනීමට කටයුතු කරමි. |

3.5 ප්‍රසම්පාදනය

ප්‍රසම්පාදන සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කල යුතුවේ. | පිළිතුරු ඉදිරිපත් කර නැත |